නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම - 2020
-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්වාගණනය කල මතය
------------------------------

නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ (“සමාගම”) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

විශේෂිත කරුණු
----------------

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 1.2 වෙත අවධානය යොමු කරවමි. ඉහත සටහනේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජය මෙහෙයවනු ලබන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් සමාගමේ කටයුතු මෙහෙයවීම හා පාලනය සිදු කරනු ලැබේ.

2018 අගෝස්තු 28 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සීමිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඈවර කිරීම සහ සීමිත නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම වෙනත් ආයෝජකයකු වෙත විකිණීම, මහ බැංකුවේ අනුමැතියට යටත්ව සිදු කල යුතු බව තීරණය කර තිබුණි.

කෙසේ වුවත් 2020 පෙබරවාරි 26 නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමෙන් ඉහත දැක්වූ අමාත්‍ය මණ්ඩල තීරණය සංශෝධනය කර තිබුණි. එහි නැට්වෙල්ත් සෙකියුරිටීස් සීමිත සමාගමේ නව කොටස් වලින් සියයට 49 ක් පමණක් විකිණීමට සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වන තෙක් නැට්වෙල්ත් කෝපරේෂන් සමාගමේ ඈවර කිරීම අත්හිටුවන ලෙසද දක්වා තිබුණි.

කෙසේ වෙතත් 2020 ඔක්තෝබර් 12 වන දින නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් සහ නැට් වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් යන සමාගම් දෙකම ඈවර කිරීමට තවත් කැබිනට් තීරණයක් ගෙන තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (ශ්‍රී. ලං. ම. බැ.) විසින් 2020 මැයි 31 දින පටන් මාස හයක කාලයක් සඳහා ප්‍රාථමික ගනුදෙනු ලෙස ව්‍යාපාර ක්‍රියාකාරකම් කරගෙන යැමට සමාගමට ඇති අවසරය අත්හිටුවා තිබුණි.

පසුව එම සමාගම් දෙකම ඈවර කිරීමට 2020 ඔක්තෝබර් 12 දින ගෙන තිබූ කැබිනට් තීරණයට අනුව 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික ගනුදෙනු අවසර බලපත්‍රය ඉවත් කර ගැනීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය සලකා බැලීමෙන් පසු 2020 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාථමික ගනුදෙනුකරුවකු ලෙස කටයුතු කිරීම සඳහා නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගමේ වෙත ලබා දී ඇති පත්වීම ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි.

මෙම කරුණු සම්බන්ධයෙන්, මාගේ වාර්තාවේ වෙනසක් ඇති කර නොමැත.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා

වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්

"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී. ලං. ගි. ප්‍ර. 24 ට අනුව, මූල්‍ය ප්‍රකාශන මගින් ආවරණය වන කාල සීමාව තුල සමාගමට සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනුවක් සිදුකර තිබේ නම්, එම සම්බන්ධිත පාර්ශව සමග ඇති සම්බන්ධතාවයේ ස්වභාවය මෙන්ම එම ගනුදෙනු පිළිබඳ තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශන වලට ඇති සම්බන්ධතාවයේ බලපෑම අවබෝධ කරගැනීමට අවශ්‍ය සහ හිඟ ශේෂයන් පිලිබඳ තොරතුරු හෙලිදරවු කල යුතුය. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, නැට් වෙල්ත් සිකියුරිටීස් ලිමිටඩ්හි සම්බන්ධිත සමාගම් පාර්ශවයක් වන අතර යථායෝග්‍ය විගණනය සහ අනෙකුත් ගෙවීම් සඳහා භාරකාර අරමුදලට ගෙවිය යුතු රුපියල් මිලියන 5.57 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල සටහන් වල පෙන්වා දී නොතිබුණි. | ශ්‍රී. ලං. ගි. ප්‍ර. 24 ට අනුව ගනුදෙනුව සඳහා අදාල පාර්ශව සම්බන්ධතාව ඉදිරි මූල්‍ය වර්ෂයේදී හෙලිදරවු කෙරේ. | සමාගම ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම සමාගම සඳහා තක්සේරු වර්ෂ 2008/2009, 2009/2010, 2010/2011, 2011/2012, 2013/2014, 2014/2015, 2015/2016 සහ 2017/2018 සඳහා පිලිවෙලින් රු. 24,136,857 රු. 77,382,317 රු. 84,378,708 රු. 66,181,759, රු. 18,288,933 රු. 113,687,212, රු. 36,466,487 සහ රු. 11,058,742 ක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් බදු තක්සේරු ලැබී තිබුණි. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම විසින් ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. එහෙත් එය ගෙවිය යුතු බවට මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ආදායම් බදු සහ වැට් බදු පනතේ ඇති අපැහැදිලි ප්‍රතිපාදන හේතුවෙන් සමාගම විසින් (නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම) ගෙවිය යුතු ආදායම් බදු සහ අගය එකතු කල බද්ද මෙම වසරේ (2020) සහ ඊට පෙර වසරවලදී ගිණුම් පොත් වල ඇතුලත් කර නොමැත. දැනටමත් අභියාචනාධිකරණයේ නඩු 02 ක් හා බදු අභියාචනා කොමිසමේ නඩු 05 ක් විභාග වෙමින් පවතී. සමාගම (නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම) ඇවර කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කල බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය දඩ මුදල් ඉවත් කිරීමත් සමග බදු වගකීම් | සමාගම මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය ගැලපීම් කල යුතුය. |
| (ආ) | මූල්‍ය සේවාවන් සඳහා එකතු කල අගය මත බදු තක්සේරු 2013 වර්ෂය සඳහා වටිනාකම රු. 16,600,601 සහ 2014 වර්ෂය සඳහා | | සමාගම මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය ගැලපීම් කල යුතුය. |

| | | |
|---|---|---|
| වටිනාකම රු. **58,097,943** ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. කෙසේ වෙතත් එය පියවීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනයේ ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි. | සියල්ල පියවීමට තීරණය කෙරේ.<br>ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සමග සාකච්ඡාවක් පවත්වා ඇති අතර ඔහු විසින් ඒ අනුව පියවීම සඳහා කැමැත්ත ලබා දී ඇත.<br>එබැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අවසන් එකඟතාවය ඇතිකර ගත් පසුව ගෙවිය යුතු බදු සියල්ල **2021** වසර වන විට ගිණුම් පොත්වලට ඇතුලත් කෙරේ. | |

**2.** මූල්‍ය සමාලෝචනය

---

**2.1** මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **51,127,270** ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. **224,420,525** ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **173,293,255** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආයෝජන ආදායම රු. **150,164,969** කින් අඩු වීම සහ රු. **162,901,677** ක සුරකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ ලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

(අ) **2020** වර්ෂයේ රු. **1,309,341** ක් වූ පොලී වියදම් ඉකුත් වර්ෂයේ පොලී වියදම වූ රු. **119,096,047** සමග සැසඳීමේදී සමාගමේ පොලී වියදම සියයට **98.8** ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) **2020** වර්ෂයේ සුරකුම්පත් ගනුදෙනු නැවත තක්සේරු කිරීමෙන් ලද පාඩුව රු. **10,887,052** ක් වූ අතර ඉකුත් වර්ෂයේ සුරකුම්පත් ගනුදෙනු නැවත තක්සේරු කිරීමෙන් ලද ලාභය රු. **152,014,625** සමඟ සැසඳීමේදී සියයට **107** ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

**3.** මෙහෙයුම් සමාලෝචනය

---

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම ප්‍රාථමික ගණුදෙනුකරුවකු ලෙස ව්‍යාපාරික කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටුවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් කොන්දේසි සහිතව මාස **06** සඳහා අවලංගු කිරීමට තීරණය කර තිබුණි. මෙහිදී සමාගමේ අයිතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම අවසන් කරන තෙක් සහ මාසිකව සමාගමේ වර්ධනය පිලිබඳ වාර්තා ඉදිරිපත් කල යුතු විය. ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් වන තෙක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය අවසන් කිරීමට අවස්ථාව නොමැත. තවද සමාගම විසින් | රටේ පවතින වර්තමාන තත්වය හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම ඉදිරියට කරගෙන යැමට සමාගම් වලට නොහැකි වීමෙන් කොන්දේසි ප්‍රකාරව ක්‍රියාකිරීමට නොහැකි විය. | සමාගම නියමිත වේලාවට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විමර්ෂණ හා අධීක්ෂණ කටයුතු සිදු කිරීමේදී ප්‍රාථමික හා ද්විතීක වෙළඳපොළේ රජයේ සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු වලට ඵලදායීව සහභාගී වීම සිදුකළ යුතු අතර සියළු අවස්ථා වල සමාගම අදාළ නීතිරීති හා රෙගුලාසි මාර්ගෝපදේශ වලට එකඟ විය යුතුය. කෙසේ වෙතත් එම කොන්දේසි වලට අනුකූල වීමට සමාගම අපොහොසත් වීම නිසා ප්‍රාථමික ගනුදෙනු කරුවකු ලෙස ව්‍යාපාර කටයුතු සිදු කිරීම අත්හිටුවන ලදී. | | |
| (ආ) | 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගම් 02 කට ගෙවන ලද රු 19,725,000 ක් වූ අනවසර තැරැව් ගාස්තු සම්බන්ධයෙන් සමාගම විසින් 2016 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබූ අතර 2021 සැප්තැම්බර් 30 වන විටත් කිසිදු තීරණයක් ලැබී නොතිබුණි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු අඛණ්ඩව සිදු කෙරෙන අතර සමාගම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහය වීම සඳහා නීති උපදේශකයකු පත් කර ඇත. | මේ සම්බන්ධයෙන් කඩිනමින් පියවර ගන්නා ලෙස නිර්දේශ කෙරේ. |
| (ඇ) | සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී සහ හිටපු ප්‍රධාන ගණුදෙනුකරු, ට්‍රිලියන් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම සහ වර්වුවල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ට්‍රේඩින් (පුද්ගලික) සමාගම සමග අවිධිමත් ගණුදෙනු සිදු කර තිබුණි.<br>ට්‍රිලියන් සෙකියුරිටීස් පුද්ගලික සමාගම විසින් සමාගමට එරෙහිව නඩුවක් පවරා තිබූ අතර තීන්දුව 2018 නොවැම්බර් 02 දින ලැබී තිබුණි. මහාධිකරණ තීන්දුවට අනුව සමාගම විසින් රු. 53,830,745 ක මුදල 2014 ජුලි 25 දින සිට සියයට 14 ක පොලී අනුපාතයක් සමඟද රු. 72,519 ක මුදල 2014 ජුලි 31 දින සිට සියයට 14 ක පොලී අනුපාතයක් සමඟද ට්‍රිලියන් සෙකියුරිටීස් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු විය. නමුත් 2021 සැප්තැම්බර් 30 වන විටත් එය පියවා නොතිබුණි. | කම්ටු නිර්දේශය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත රුපියල් මිලියන 95 ක අවසන් පියවීම 2021 ජුනි 29 වන දින ගෙවා වගකීම් පියවා ඇත. | සමාගම නියමිත වේලාවට අවශ්‍ය පියවර ගත යුතුය. |